GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

GMOA/Media/2014/0001
27/01/2014

සියලුම මාධ්‍ය ආයතන වෙත,

පසුගිය කාලය තුල රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංසදය නමින් (GMOF) මාධ්‍ය වාර්තා කිහිපයක් පල වූ අතර එමගින් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ (GMOA) ප්‍රතිරූපයට හානියක් සිදු වන බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකත්වයේ මතය වී ඇත.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංසදය ලෙසින් නිත්‍යානුකූල වෘත්තීය සමිතියක් ලියාපදිංචි වී නොමැති අතර මෙය පුද්ගලයන් කිහිප දෙනෙකු විසින් සිදු කරන ක්‍රියාවලියක් බව අපට දැනගන්නට ලැබී ඇත. මෙම සුළු පිරිස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික ප්‍රතිපත්ති වලට පටහැනිව සෞඛ්‍යය සම්බන්ධව යම් යම් මාධ්‍ය නිවේදන නිකුත් කිරීම තුලින් ජාතික ප්‍රතිපත්තිය අභියෝගයට ලක් වන අතර වක්‍රාකාරව යම් සමාගම් වලට වාසි සහගත වන ප්‍රකාශ කරමින් ඉලක්කයන් සපුරන බව අප සාමාජිකත්වයේත් මතය වී ඇත. මොවුන් වෙබ් අඩවි තුලින්ද මෙම නිර්නාමික ප්‍රකාශයන් කරමින් වෛද්‍ය වෘත්තියට නුසුදුසු අයුරින් මෙම ක්‍රියාවලිය සිදු කරමින් සිටී.

මේ අනුව මෙම නිත්‍යානුකූල නොවන පිරිස පිළිබඳ දෙපාර්තුමේන්තු මට්ටමේ පරීක්ෂණයක් කරන ලෙසත් අපරාධ විමර්ශණ දෝර්තුමේන්තුව මගින් විමර්ශණයක් ආරම්භ කරන ලෙසත් අප අදාල අංශ වෙතින් මේ වන විටත් ඉල්ලීම් කර ඇත.

ස්තූතියි

For
වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්